## පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව

# 2021

## 07

## ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය -2021

# ඇගයීම් වාර්තාව

## 07 - ඉතිහාසය

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හය විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින්වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
පිරිවෙන් සාමාන්‍ය පෙළ ඉතිහාසය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය , I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය , I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේද I ප්‍රශ්න පත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024 ජූලි 31
පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ජාතික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දැ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කෑරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවිව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරණ පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂය ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්. සී ප්‍රියදර්ශනී<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව) |
| සංස්කරණය | : | සම්මානිත මහාචාර්ය යූ. බී කරුණානන්ද<br>ජ්‍යෝෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br><br>ඩී. එච්. සී. එන් ධර්මපාල<br>අධ්‍යක්ෂ, ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම |
| ලේඛක මණ්ඩලය | : | සම්මානිත මහාචාර්ය යූ. බී කරුණානන්ද<br>ජ්‍යෝෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br><br>මහාචාර්ය කේ. එම්. පී කුලසේකර<br>ජ්‍යෝෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br><br>ඩී. එච්. සී. එන් ධර්මපාල<br>අධ්‍යක්ෂ, ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම<br><br>පූජ්‍ය දේවාලේගම චන්දිම හිමි<br>ගුරු උපදේශක<br>ර/ඥාණෝභාස මහ පිරිවෙන<br>මල්වල, රත්නපුර |
| පරිගණක පිටපත සැකසුම | : | ආර්.ඒ.එන්.එම් පෙරේරා<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ඒ. එල්. කේ චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

# පටුන


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | i |
| පෙරවදන | ii |
| පටුන | iv |
| වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය | v |
| 1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු | 01 |
| 1.1.ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු | 01 |
| 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමක තොරතුරු | 02 |
| **I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | 05 |
| 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | 06 |
| 2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 06 |
| 2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) | 07 |
| 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය | 13 |
| 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය | 15 |
| 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා | 19 |
| **II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | 21 |
| 3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු | 22 |
| 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 22 |
| 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය | 23 |
| 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය | 23 |
| 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය | 24 |
| 3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 25 |
| 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන | 44 |
| 4. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයින් අවධානය යොමුකළ යුතු කරුණු | 45 |
| 5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා | 46 |

## වගු නාමාවලිය


| | පිටු අංකය |
|---|---|
| වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 2 |
| වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය | 2 |
| වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව | 3 |
| වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව | 4 |
| වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 12 |
| වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 14 |
| වගුව 2.3 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක | 15 |
| වගුව 2.4 තේමාව අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය සහ ඒවායේ පහසුතාව | 17 |


## ප්‍රස්තාර නාමාවලිය


| | පිටු අංකය |
|---|---|
| ප්‍රස්තාරය 2.1 I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 13 |
| ප්‍රස්තාරය 2.2 I පත්‍රයේ තේමා අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය | 16 |
| ප්‍රස්තාරය 2.3 I පත්‍රය - තේමා අනුව පහසුතාව හා ඉදිරිපත් වී ඇති ප්‍රශ්න ප්‍රතිශතය | 18 |
| ප්‍රස්තාරය 3.1 II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 23 |
| ප්‍රස්තාරය 3.2 II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 23 |
| ප්‍රස්තාරය 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයේ කොටස්වල/ අනුකොටස්වල පහසුතා දර්ශකය | 24 |
| ප්‍රස්තාරය 3.4 (a) 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 28 |
| ප්‍රස්තාරය 3.4 (b) 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 28 |
| ප්‍රස්තාරය 3.5 (a) 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 30 |
| ප්‍රස්තාරය 3.5 (b) 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 30 |
| ප්‍රස්තාරය 3.6 (a) 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 32 |
| ප්‍රස්තාරය 3.6 (b) 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 32 |
| ප්‍රස්තාරය 3.7 (a) 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 34 |
| ප්‍රස්තාරය 3.7 (b) 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 34 |
| ප්‍රස්තාරය 3.8 (a) 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 36 |
| ප්‍රස්තාරය 3.8 (b) 5 ප්‍රශ්නයෙහි කොටස්වල හා අනුකොටස්වල පහසුතාවය | 36 |
| ප්‍රස්තාරය 3.9 (a) 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 38 |
| ප්‍රස්තාරය 3.9 (b) 6 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 38 |
| ප්‍රස්තාරය 3.10 (a) 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 40 |
| ප්‍රස්තාරය 3.10 (b) 7 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාවය | 40 |
| ප්‍රස්තාරය 3.11 (a) 8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 43 |
| ප්‍රස්තාරය 3.11 (b) 8 ප්‍රශ්නයෙහි කොටස්වල හා අනුකොටස්වල පහසුතාවය | 43 |
| ප්‍රස්තාරය 3.12 එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 44 |

# 1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1. ඉතිහාසය විෂයය අධ්‍යයනයේ අරමුණු

1. මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විවිධාකාර වූ ස්වභාවය බුද්ධිමත් ව, නිරවුල් ව නිර්මාණශීලී ව හා විවේචනාත්මක ව වටහා ගැනීම
2. අතීතය මත පදනම් ව වර්තමානය ගොඩනැගෙන බැවින් වර්තමානය මත පදනම් ව ගොඩනැගෙන අනාගතය වඩා ඵලදායි කරලීම.
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දැ හිතකාමී පුරවැසියෙකු සතු කුසලතා වර්ධනය කිරීම.
4. ඓතිහාසික ව වැදගත් භූමිකා ඉටුකළ පුද්ගලයින්ගේ චරිතාපදාන චරිතායනය කිරීම.
5. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳව අභිමානවත් හැඟුමෙන් කටයුතු කිරීම.
6. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මකව බැලීම.
7. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය වටහාගෙන ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගැනීම.
8. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
10. ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කිරීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

**වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව**

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2191 | 12 | 2203 |
| ඉංග්‍රීසි | 16 | 0 | 16 |
| **එකතුව** | **2207** | **12** | **2219** |

**වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය**

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 122 | 5.53 | 2 | 16.67 | 124 | 5.59 |
| B | 284 | 12.87 | 1 | 8.33 | 285 | 12.84 |
| C | 810 | 36.70 | 5 | 41.67 | 815 | 36.73 |
| S | 630 | 28.54 | 2 | 16.67 | 632 | 28.48 |
| W | 361 | 16.36 | 2 | 16.67 | 363 | 16.36 |
| එකතුව | **2207** | **100.00** | **12** | **100.00** | 2219 | **100.00** |

වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමාර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමාර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමාර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 149 | 8 | 5.37 | 13 | 8.72 | 44 | 29.53 | 52 | 34.90 | 117 | 78.52 | 32 | 21.48 |
| ගම්පහ | 184 | 10 | 5.43 | 15 | 8.15 | 70 | 38.04 | 61 | 33.15 | 156 | 84.78 | 28 | 15.22 |
| කළුතර | 160 | 10 | 6.25 | 25 | 15.63 | 44 | 27.50 | 48 | 30.00 | 127 | 79.38 | 33 | 20.63 |
| මහනුවර | 228 | 36 | 15.79 | 60 | 26.32 | 80 | 35.09 | 38 | 16.67 | 214 | 93.86 | 14 | 6.14 |
| මාතලේ | 82 | 10 | 12.20 | 18 | 21.95 | 25 | 30.49 | 18 | 21.95 | 71 | 86.59 | 11 | 13.41 |
| නුවරඑළිය | 34 | 0 | 0.00 | 6 | 17.65 | 21 | 61.76 | 4 | 11.76 | 31 | 91.18 | 3 | 8.82 |
| ගාල්ල | 167 | 5 | 2.99 | 19 | 11.38 | 51 | 30.54 | 55 | 32.93 | 130 | 77.84 | 37 | 22.16 |
| මාතර | 176 | 9 | 5.11 | 31 | 17.61 | 81 | 46.02 | 42 | 23.86 | 163 | 92.61 | 13 | 7.39 |
| හම්බන්තොට | 127 | 5 | 3.94 | 16 | 12.60 | 59 | 46.46 | 30 | 23.62 | 110 | 86.61 | 17 | 13.39 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 51 | 2 | 3.92 | 7 | 13.73 | 22 | 43.14 | 11 | 21.57 | 42 | 82.35 | 9 | 17.65 |
| ත්‍රිකුණාමලය | 12 | 0 | 0.00 | 2 | 16.67 | 9 | 75.00 | 1 | 8.33 | 12 | 100.00 | 0 | 0.00 |
| කුරුණෑගල | 204 | 7 | 3.43 | 15 | 7.35 | 69 | 33.82 | 61 | 29.90 | 152 | 74.51 | 52 | 25.49 |
| පුත්තලම | 46 | 1 | 2.17 | 0 | 0.00 | 20 | 43.48 | 21 | 45.65 | 42 | 91.30 | 4 | 8.70 |
| අනුරාධපුර | 135 | 3 | 2.22 | 12 | 8.89 | 51 | 37.78 | 47 | 34.81 | 113 | 83.70 | 22 | 16.30 |
| පොළොන්නරුව | 55 | 3 | 5.45 | 5 | 9.09 | 16 | 29.09 | 19 | 34.55 | 43 | 78.18 | 12 | 21.82 |
| බදුල්ල | 105 | 3 | 2.86 | 11 | 10.48 | 33 | 31.43 | 38 | 36.19 | 85 | 80.95 | 20 | 19.05 |
| මොණරාගල | 70 | 4 | 5.71 | 10 | 14.29 | 19 | 27.14 | 23 | 32.86 | 56 | 80.00 | 14 | 20.00 |
| රත්නපුර | 131 | 2 | 1.53 | 11 | 8.40 | 57 | 43.51 | 33 | 25.19 | 103 | 78.63 | 28 | 21.37 |
| කෑගල්ල | 102 | 6 | 5.88 | 9 | 8.82 | 44 | 43.14 | 29 | 28.43 | 88 | 86.27 | 14 | 13.73 |
| සමස්ත ප්‍රතිඵලය | **2,219** | **124** | **5.59** | **285** | **12.84** | **815** | **36.73** | **632** | **28.48** | **1,856** | **83.64** | **363** | **16.36** |

**වගුව 1.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 0 | 0.00 | 2219 | 100.00 |
| 81 - 90 | 13 | 0.59 | 2219 | 100.00 |
| 71 - 80 | 99 | 4.46 | 2206 | 99.41 |
| 61 - 70 | 258 | 11.63 | 2107 | 94.95 |
| 51 - 60 | 489 | 22.04 | 1849 | 83.33 |
| 41 - 50 | 538 | 24.25 | 1360 | 61.29 |
| 31 - 40 | 426 | 19.20 | 822 | 37.04 |
| 21 - 30 | 277 | 12.48 | 396 | 17.85 |
| 11 - 20 | 114 | 5.14 | 119 | 5.36 |
| 01 - 10 | 5 | 0.23 | 5 | 0.23 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

ඉහත වගුවෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා**:** (31-40) පන්ති ප්‍රාන්තරය සැලකීමේ දී,
ඉතිහාසය විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2219 අතුරෙන් 31-40 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 426කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.20කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 822ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 37.04කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය : පැය **01** යි.

වරණ **04** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40** කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **40**කි.

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. *(ලකුණු 01 × 40 = 40 යි)*

1. "සමස්ත මානව සමාජයේ අතීතය අධ්‍යයනය කිරීම ඉතිහාසයයි." මෙම ප්‍රකාශය කළේ කවු ද?
   (1) ජී.එම්. ට්‍රැව්ලියන් (2) ඊ.එච්. කාර් (3) ටොලමි (4) කොස්මස්

2. පළමුවන විජයබාහු රජු තුන් නිකායටම තුලාභාර දුන්බව සඳහන් සෙල්ලිපිය කුමක් ද?
   (1) තෝනිගල (2) අඹගමුව
   (3) වේලෙයික්කාර (4) දෙවනගල

3. ශ්‍රී ලංකාවේ මහාශිලා (මෙගලිතික) සුසාන පිහිටි ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
   (1) පාහියංගල (2) අලිගල (3) මිනිහාගල්කන්ද (4) ඉබ්බන්කටුව

4. දේවානම්පියතිස්ස රජතුමා විසින් පාටලිපුත්ත නගරයට යවන ලද දූත පිරිසේ නායකයා වූයේ කවු ද?
   (1) භණ්ඩුක (2) අරිට්ඨ (3) ජෝතිය (4) කාලවේල

5. සමකාලීන සෙල්ලිපිවල "පිතිමහරජ" නමින් හඳුන්වා ඇති රජතුමා කවු ද?
   (1) වළගම්බා (2) ධාතුසේන (3) වසභ (4) නිශ්ශංකමල්ල

6. කාශ්‍යප රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කර බෝ උපුල් කසුප්ගිරි වෙහෙර වශයෙන් හැඳින්වූ විහාරය වන්නේ,
   (1) මහා විහාරයයි (2) අභයගිරියයි
   (3) ඉසුරුමුණි විහාරයයි (4) ජේතවනාරාමයයි

7. සාරාර්ථ සංග්‍රහය නම් වූ වෛද්‍ය ග්‍රන්ථය රචනා කරනු ලැබූ රජතුමා කවු ද?
   (1) පළමුවන අග්බෝ (2) දෙවන සේන (3) දුටුගැමුණු (4) බුද්ධදාස

8. කඳවුරු නුවර, කඳවුරුපිටිය නමින් හැඳින්වූ රාජධානිය කුමක් ද?
   (1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) දඹදෙණිය (4) යාපහුව

9. ගම්පොළ යුගයේ රචිත සංදේශයක් වන්නේ මින් කුමක් ද?
   (1) හංස (2) තිසර (3) ගිරා (4) කෝකිල

10. ශ්‍රී ලාංකිකයන්ට සර්වජන ඡන්දබලය ලබාදුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක් ද?
   (1) මැකලම් (2) මැනිං (3) ඩොනමෝර් (4) සෝල්බරි

11. වනවාසී සම්ප්‍රදාය පිහිටුවීමේ අරමුණින්, පලාබත්ගල ප්‍රදේශයේ වන සෙනසුනක් ආරම්භ කළ රජතුමා කවු ද?

(1) නිශ්ශංකමල්ල (2) තුන්වන විජයබාහු
(3) දෙවන පරාක්‍රමබාහු (4) පළමුවන බුවනෙකබාහු

12. බයිලා සංගීතය ශ්‍රී ලාංකික ජන සමාජයට එකතු වූයේ,

(1) ස්පාඤ්ඤවරුන්ගෙනි. (2) පෘතුගීසීන්ගෙනි.
(3) ලන්දේසීන්ගෙනි. (4) ඉංග්‍රීසීන්ගෙනි.

13. ශ්‍රී ලංකාව අතීතයේ දී තැප්‍රොබේන් වශයෙන් හැඳින්වූයේ,

(1) චෝළයන් ය. (2) ග්‍රීකයන් ය. (3) රෝමවරුන් ය. (4) අරාබීන් ය.

14. ගෘහ නිර්මාණ ශිල්පයට අයත් ආරුක්කු සහ ගෝලාකාර ශිඛර යන අංග ලෝකයට හඳුන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද?

(1) ගුප්තවරු (2) ග්‍රීකවරු (3) රෝමවරු (4) මෝගල්වරු

15. වර්තමාන ලාඕසයේ රාජ්‍ය ආගම කුමක් ද?

(1) හින්දු (2) ක්‍රිස්තියානි (3) ඉස්ලාම් (4) බුද්ධාගම

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෙ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම **නොගැළපෙන** නාමය තෝරන්න.

16. (1) ආරාම (2) දාගැබ් (3) බෝධිඝර (4) සඳකඩ පහණ

17. (1) ථූපාරාමය (2) වෙස්සගිරිය (3) අභයගිරිය (4) ජේතවනාරාමය

18. (1) එස්. මහින්ද හිමි (2) වස්කඩුවේ සුභූති හිමි
(3) කඩහපොල හිමි (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

19. (1) දන්තුරේ සටන (2) මුල්ලේරියා සටන
(3) බලන සටන (4) රන්දෙණිවෙල සටන

20. (1) ඉන්දියාව (2) කොරියාව (3) චීනය (4) ජපානය

- අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම **නොගැළපෙන** නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) විජය - අනුරාධ (2) වසභ - ඉසිගිරි
(3) දුටුගැමුණු - නන්දමිත්‍ර (4) වළගම්බා - මිගාර

22. (1) සේනගුත්තික - සුරතිස්ස රජු
(2) පුලහත්ථ ඇතුලු පිරිස - වළගම්බා රජු
(3) පණ්ඩු ඇතුලු දමිළ සත්දෙනා - මිත්තසේන රජු
(4) පළමුවන රාජරාජ - ධාතුසේන රජු

23. (1) සෝමා දේවිය - අනුරාධපුර (2) සුගලා දේවිය - පොළොන්නරුව
(3) ලීලාවතී දේවිය - දඹදෙණිය (4) සුනේත්‍රා දේවිය - කෝට්ටේ

24. (1) දෙවන පරාක්‍රමබාහු - කැරගල පත්මාවතී පිරිවෙන පිහිටුවීම
(2) පළමුවන බුවනෙකබාහු රජු - දළදාවහන්සේ යාපහුවට ගෙන ඒම
(3) හතරවන පරාක්‍රමබාහු රජු - මහනුවර අස්ගිරි විහාරය ඉදිකර වීම
(4) සේනාධිලංකාර සෙනවි - ලංකාතිලක විහාරය ඉදි කිරීම

25. (1) බුත්සරණ - අනුරාධපුර (2) සසදාවත - පොළොන්නරුව
(3) කව්සිළුමිණ - දඹදෙණිය (4) සද්ධර්මාලංකාරය - ගම්පොළ

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (*A*), (*B*), (*C*) හා (*D*) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

  (*A*) සහ (*B*) පමණක් නිවැරදි නම්, අංක **1** ද,

  (*B*) සහ (*C*) පමණක් නිවැරදි නම්, අංක **2** ද,

  (*C*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **3** ද,

  (*A*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **4** ද,

  සලකුණු කරන්න.

26. දසමහා යෝධයන් සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – කාවන්තිස්ස රජතුමා දසමහා යෝධයන්ගෙන් සමන්විත හමුදාවක් සංවිධානය කිරීම
(*B*) – දසමහා යෝධයන්ගේ ප්‍රධානියා සුරනිමල වීම
(*C*) – මෙම පිරිස රුහුණු ප්‍රදේශයෙන් පමණක් තෝරා ගැනීම
(*D*) – මෙම පිරිසේ සහයෝගයෙන් දුටුගැමුණු රජු රජරට ජය ගැනීම

27. ග්‍රීකයන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාස පිළිබඳ පහත කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – බහුදේවවාදය විශ්වාස කිරීම
(*B*) – හෙරානා ඇතැන්ස් පෞර රාජ්‍ය ආරක්ෂා කරන දේවතාවිය වීම
(*C*) – ශක්තිමත් පූජක පක්ෂයක් මෙහි විසීම

28. ලන්දේසීන්ගේ ආගමික කටයුතු සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – සිංහල භාෂාවෙන් පමණක් ආගම් ප්‍රචාරය කිරීම
(*B*) – ක්‍රිස්තියානි දේශකයන් හා දේවගැතිවරුන් පුහුණු කිරීම සඳහා සෙමනේරි ඇති කිරීම
(*C*) – රෙපරමාදු ආගමිකයන්ට පමණක් ම නිලතල සහ වරප්‍රසාද ලබාදීම
(*D*) – කතෝලිකයින්ට සහන සැලසීම

29. අශෝක රජුගේ ධර්මවිජය ප්‍රතිපත්තිය හා සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – බුද්ධාගම හැර සෙසු ආගම් නොසලකා හැරීම
(*B*) – කැලෑ කපා මංමාවත් තැනවීම
(*C*) – මව්පියන්ට සහ වැඩිහිටියන්ට ගරු කිරීම
(*D*) – සත්‍යවාදී වීම හා සිතින් ගතින් පිරිසිදු වීම

30. 1848 දෙවන නිදහස් සටනට පසුබිම් වූ හේතු සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශන නිවැරදි වේ ද?

(*A*) – දොරේසාමි නැමැත්තෙකු උඩරට රාජත්වය සඳහා උරුමකම් කියමින් ඉදිරිපත් වීම

(*B*) – 1833 අධිකරණ ප්‍රතිසංස්කරණ නිසා ජනතාව අපහසුතාවයට පත්වීම

(*C*) – වතුවගාව සඳහා ඉඩම් විකිණීමට නීති සකස් කිරීම

(*D*) – රදල ප්‍රධානීන්ගේ වරප්‍රසාද හා ආදායම් මාර්ග අහිමි වීම

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් ***X*** හා ***Y*** තීරුවල ඇත. ***Y*** තීරුවේ ඇති නාම/ප්‍රකාශන ***X*** තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ***Y*** තීරුවේ ඒවා ***X*** තීරුවේ අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | සොරබොර වැව | *A* – | පළමුවන අග්බෝ රජු |
| (2) | අභය වැව | *B* – | මහසෙන් රජු |
| (3) | ගිරිතලේ වැව | *C* – | පණ්ඩුකාභය රජු |
| (4) | හුරුළු වැව | *D* – | දුටුගැමුණු රජු |

(1) *A, C, D, B* (2) *A, B, C, D* (3) *C, D, B, A* (4) *D, C, A, B*

32.

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | රක්ඛිත තෙර | *A* – | මහාරට්ඨ |
| (2) | මහා ධම්මරක්ඛිත තෙර | *B* – | අපරන්ත දේශය |
| (3) | මහා මහින්ද තෙර | *C* – | වනවාස දේශය |
| (4) | යෝනක ධම්මරක්ඛිත තෙර | *D* – | තම්බපණ්ණි |

(1) *A, B, C, D* (2) *B, D, A, C* (3) *C, A, D, B* (4) *D, A, B, C*

33.

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | මල්වතු ඔය | *A* – | වනවාහිනී නදී |
| (2) | කලා ඔය | *B* – | කප්පකන්දර නදී |
| (3) | වලවේ ගඟ | *C* – | ගෝණ නදී |
| (4) | මැණික් ගඟ | *D* – | කදම්බ නදී |

(1) *B, A, C, D* (2) *C, D, B, A* (3) *D, A, B, C* (4) *D, C, A, B*

34.

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | ශාක්‍යයන්ගේ | *A* – | මිථිලා |
| (2) | ලිච්ඡවීන්ගේ | *B* – | කේසපුත්ත |
| (3) | විදේහයන්ගේ | *C* – | කපිලවස්තු |
| (4) | කාලාමයන්ගේ | *D* – | වේසාලි |

(1) *A, C, D, B* (2) *C, B, A, D* (3) *C, D, A, B* (4) *D, A, B, C*

35.

| | *X* | | *Y* |
|---|---|---|---|
| (1) | මහලේනා | *A* – | ඡත්‍රය දරන්නා |
| (2) | ශෙනපති | *B* – | ප්‍රධාන ලේකම් |
| (3) | දොවාරික | *C* – | සේනාපති |
| (4) | ජත්තගාහක | *D* – | දොරටුපාල |

(1) *A, B, D, C* (2) *B, C, D, A* (3) *C, D, A, B* (4) *D, A, B, C*

- අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා, එහි **අංකය** සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |


| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | ක්‍රි.ව. 1017 රාජේන්ද්‍ර රජු රජරට ආක්‍රමණය කළේ ය. | රාජේන්ද්‍ර රජු රජරට ආක්‍රමණය කළ අවධියේ රජරට පාලකයා වූයේ මානවම්ම රජු ය. |
| 37. | මුහුදු සේද මාවත වැටී තිබුණේ ඉතාලියේ සිට කොන්ස්තන්තිනෝපල් වරාය දක්වා ය. | ලොරෙන්සෝ ද අල්මේදා ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණියේ ය. |
| 38. | පෘතුගීසින් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශය තුළ කතෝලික ආගම ප්‍රචාරය කළේ ය. | පාන්, අච්චාරු, දෝසි පෘතුගීසින්ගෙන් අපට ලැබුණු ආහාර වර්ග කිහිපයකි. |
| 39. | පුරවැසියන් සියලු දෙනාම සෘජුවම ආණ්ඩු කිරීමේ කාර්යයට සම්බන්ධ වීම ග්‍රීක පාලන ක්‍රමයේ විශේෂ ලක්ෂණයකි. | කෝලෝසියම ක්‍රීඩාගාරය පිහිටියේ ග්‍රීසියේ ය. |
| 40. | ජපානයට බුදු දහම හඳුන්වා දුන්නේ ෂෝතොකු කුමරු විසිනි. | ෂෝතොකු කුමරු අවලෝකිතේශ්වර බුදුන්ගේ අවතාරය ලෙස ජපන් වැසියන් සලකයි. |

**වගුව 2.1 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | (1) | 21. | (4) |
| 02. | (3) | 22. | (4) |
| 03. | (4) | 23. | (3) |
| 04. | (2) | 24. | (1) |
| 05. | (1) | 25. | (1) |
| 06. | (3) | 26. | (4) |
| 07. | (4) | 27. | (1) |
| 08. | (2) | 28. | (2) |
| 09. | (2) | 29. | (3) |
| 10. | (3) | 30. | (2) |
| 11. | (3) | 31. | (4) |
| 12. | (2) | 32. | (3) |
| 13. | (2) | 33. | (4) |
| 14. | (3) | 34. | (3) |
| 15. | (4) | 35. | (2) |
| 16. | (4) | 36. | (2) |
| 17. | (1) | 37. | (3) |
| 18. | (3) | 38. | (1) |
| 19. | (2) | 39. | (2) |
| 20. | (1) | 40. | (4) |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.3 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය




- 26 -

**ප්‍රස්තාරය 2.1** (RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 4 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.73කි. එනම් 4 ප්‍රශ්නය සඳහා අපේක්ෂකන්ගෙන් 73%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව එම ප්‍රශ්නයේ පහසුතාව 73%ක් ලෙස දැක්විය හැකිය.

වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 1 | 52.93 | 33.11 | 10.74 | 3.13 | 0.10 |
| 2 | 3 | 32.20 | 24.10 | 21.17 | 22.34 | 0.20 |
| 3 | 4 | 21.29 | 9.47 | 15.43 | 53.61 | 0.20 |
| 4 | 2 | 7.80 | 74.34 | 9.66 | 8.00 | 0.20 |
| 5 | 1 | 36.78 | 22.44 | 24.59 | 16.10 | 0.10 |
| 6 | 3 | 11.22 | 26.34 | 52.59 | 9.66 | 0.20 |
| 7 | 4 | 25.46 | 8.20 | 6.73 | 59.61 | 0.00 |
| 8 | 2 | 14.26 | 57.13 | 12.60 | 15.72 | 0.29 |
| 9 | 2 | 15.22 | 52.29 | 15.12 | 17.07 | 0.29 |
| 10 | 3 | 9.07 | 15.41 | 53.07 | 22.24 | 0.20 |
| 11 | 3 | 23.34 | 32.81 | 22.75 | 20.70 | 0.39 |
| 12 | 2 | 18.54 | 38.34 | 31.22 | 11.71 | 0.20 |
| 13 | 2 | 13.56 | 41.07 | 26.05 | 18.93 | 0.39 |
| 14 | 3 | 11.71 | 36.68 | 34.83 | 16.59 | 0.20 |
| 15 | 4 | 13.17 | 30.05 | 24.39 | 32.00 | 0.39 |
| 16 | 4 | 31.51 | 9.07 | 12.20 | 46.83 | 0.39 |
| 17 | 1 | 11.71 | 63.90 | 10.15 | 13.95 | 0.29 |
| 18 | 3 | 17.37 | 38.24 | 34.83 | 9.46 | 0.10 |
| 19 | 2 | 10.55 | 33.40 | 29.30 | 26.37 | 0.39 |
| 20 | 1 | 51.71 | 28.00 | 8.68 | 11.41 | 0.20 |
| 21 | 4 | 21.56 | 18.63 | 13.17 | 46.44 | 0.20 |
| 22 | 4 | 10.93 | 16.49 | 31.02 | 41.37 | 0.20 |
| 23 | 3 | 16.10 | 23.02 | 42.73 | 17.66 | 0.49 |
| 24 | 1 | 24.39 | 22.05 | 27.80 | 25.27 | 0.49 |
| 25 | 1 | 44.88 | 16.10 | 18.83 | 19.71 | 0.49 |
| 26 | 4 | 16.49 | 9.56 | 13.27 | 60.59 | 0.10 |
| 27 | 1 | 34.54 | 29.27 | 16.68 | 19.22 | 0.29 |
| 28 | 2 | 10.83 | 40.00 | 38.44 | 10.54 | 0.20 |
| 29 | 3 | 9.27 | 10.73 | 59.51 | 20.29 | 0.20 |
| 30 | 2 | 25.56 | 26.05 | 18.73 | 29.07 | 0.59 |
| 31 | 4 | 15.32 | 12.10 | 21.56 | 50.54 | 0.49 |
| 32 | 3 | 8.59 | 14.65 | 62.99 | 13.57 | 0.20 |
| 33 | 4 | 17.19 | 26.37 | 18.07 | 38.18 | 0.20 |
| 34 | 3 | 12.98 | 19.22 | 56.10 | 11.61 | 0.10 |
| 35 | 2 | 9.56 | 70.15 | 11.41 | 8.59 | 0.29 |
| 36 | 2 | 33.46 | 34.34 | 16.78 | 15.32 | 0.10 |
| 37 | 3 | 23.80 | 22.83 | 19.32 | 33.76 | 0.29 |
| 38 | 1 | 49.95 | 17.66 | 13.95 | 18.15 | 0.29 |
| 39 | 2 | 20.49 | 28.20 | 24.78 | 26.24 | 0.29 |
| 40 | 4 | 34.15 | 21.56 | 23.90 | 20.00 | 0.39 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. 'Missing' තීරයේ දක්වා ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් හෝ අපේක්ෂකයන් ප්‍රතිශතයයි.

## 2.4 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය


**ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා/ විෂය කරුණු 07කි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය පහත දැක්වේ.**

**වගුව 2.3 තේමාව හා ඊට අදාළ ප්‍රශ්න අංක**

| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| ඓතිහාසික මූලාශ්‍රය | 1,2 |
| ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම | 3,13,33 |
| ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට රජරට ශිෂ්ඨාචාරයේ අවසානය දක්වා) | 4,5,6,7,8,16,17,21,22,26,29,32,35,36 |
| ශ්‍රී ලංකාවේ ඉතිහාසය පසුකාලීන රාජධානි | 9,11,23,24,25 |
| ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන් | 10,12,18,19,28,30,37,38 |
| ලෝක ශිෂ්ඨාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා | 14,27,31,34,39 |
| ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය | 15,20,40 |

I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත ය. මෙම ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේදී පදනම් කරගත් තේමා සංඛ්‍යාව 7කි. ඒ ඒ තේමාවට ප්‍රශ්න සකස් වී ඇති ආකාරය 2.3 වගුව මගින් නිරූපණය වේ. ඒ අනුව ඓතිහාසික මූලාශ්‍රය තේමාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 02කි. එය I පත්‍රයට අදාළව 5% බර තැබීමකි. මෙම ප්‍රශ්න පත්‍රයට අනුව අඩුම බර තැබීම මෙම තේමාව සඳහා වන අතර ඉතිහාසය විෂය නිර්දේශයට අනුව අඩු කාලච්ඡේද සංඛ්‍යාවක් ඊට යොමු වී තිබීම මේ සඳහා බලපෑ හේතුව වේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම තේමාව යටතේ ඉදිරිපත් වූ ප්‍රශ්න සංඛ්‍යාව 03ක් වන අතර එය ප්‍රශ්න පත්‍රයේ 7.5%ක බර තැබීමක් වේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා තෙවන තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න සංඛ්‍යාව 14කි. එය මෙම පත්‍රයට අනුව 35%ක බර තැබීමක් ලෙස පෙන්වා දිය හැක. මෙම තේමාව සඳහා වැඩි බර තැබීමට හේතුව වූයේ විෂය නිර්දේශයට අනුව 4 සහ 5 ශ්‍රේණිවල වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක් ඊට යෙදවී තිබීමය. හතරවන තේමාව වූ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පසු කාලීන රාජධානි යන තේමාව යටතේ සැකසී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 05කි. එය මෙම පත්‍රයට අනුව 12.5%ක බර තැබීමකි. පස්වන තේමාව වූ ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන් යටතේ ප්‍රශ්න 08ක් සැකසී ඇති අතර, එය මෙම පත්‍රයේ 20%ක බර තැබීමක් වේ. ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා හයවන තේමාව ලෙස තෝරාගෙන ඇති අතර ඉන් සැකසී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 05කි. එය මෙම පත්‍රයේ 12.5%ක බර තැබීමකි. අවසාන තේමාව වූ ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය යටතේ ප්‍රශ්න 03ක් සකස් කර ඇති අතර, එය I පත්‍රයට අනුව 7.5%ක බර තැබීමක් වේ. මෙම බර තැබීම විෂය නිර්දේශයේ ඒ ඒ තේමාවලට වෙන්කර ඇති කාල පරිච්ඡේද සංඛ්‍යාව අනුව සිදුකර ඇත.

## පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021 (2022)
## 07 - ඉතිහාසය - I පත්‍රය
## තේමා අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය





**ප්‍රස්තාරය 2.2** (RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු

ඓතිහාසික මූලාශ්‍රය යන තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න 02 අතුරෙන් වැඩිම පහසුතාව සහිත පළමු ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 0.52කි. එම තේමාව යටතේ ඉදිරිපත් කර ඇති අනෙක් ප්‍රශ්නය සඳහා ද පහසුතා දර්ශකය 0.21ක් වේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම නම් තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න 03 අතුරෙන් පහසුතාව වැඩිම තුන්වන ප්‍රශ්නයෙහි පහසුතාව 53%කි. එම තේමාව යටතේ ඉදිරිපත් කර ඇති අනෙක් ප්‍රශ්න දෙක සඳහා පහසුතාව 37%ක් හෝ ඊට වැඩි අගයක් ගනී. ශ්‍රී ලංකාවේ ඉතිහාසය රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා නම් තේමාවට අදාළ ප්‍රශ්න 14න් පහසුතාව වැඩිම 4 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 0.73කි. මෙම ප්‍රශ්න 14න් 11ක් සඳහා පහසුතාව 40%කට වඩා වැඩි වේ. ප්‍රශ්න 2ක් සඳහා පහසුතාව 37%කට වඩා අඩු අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසය, පසුකාලීන රාජධානි නම් තේමාවට අදාළ ප්‍රශ්න පහම සඳහා පහසුතා දර්ශකය 0.52 වඩා අඩු අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකාව සහ බටහිර ජාතීන් යන තේමාව යටතේ ඇති ප්‍රශ්න 08න් ප්‍රශ්න 06ක් ම සඳහා පහසුතාව 40%ට වඩා අඩු අගයක් ගෙන ඇත. ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා නම් තේමාවට අදාළව ඉදිරිපත් වූ ප්‍රශ්න 5න් පහසුතාව අඩුම 39 ප්‍රශ්නයෙහි පහසුතාව 28%ක් වේ. ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය නම් තේමාවට අදාළව ඉදිරිපත් වූ ප්‍රශ්න සංඛ්‍යාව 03කි. ඒ අතුරින් ප්‍රශ්න 02ක් සඳහා පහසුතාව 32%ට අඩු අගයක් ගෙන ඇත.

මෙම I පත්‍රයට අනුව 2, 11, 17, 24, 37, 40 යන ප්‍රශ්න අවම පහසුතාවක් එනම් 25%ට අඩු පහසුතාවක් සහිත ප්‍රශ්න වේ. බොහෝ දුරට මීට හේතු වන්නට ඇත්තේ එම ප්‍රශ්න දැනුමම පරීක්ෂා කිරීම සඳහාම යොමු වීම වන අතර සිසුන්ගේ අවධානය හා මතකය මේ සඳහා අවම වීම බව කිව හැකිය.

**වගුව 2.4 තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය එහි පහසුතාව හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව**

| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව |
|---|---|---|
| ඓතිහාසික මූලාශ්‍රය | (1) 0.52% | (2) 0.21 |
| ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම | (3) 0.53% | (33) 0.37 |
| ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ප්‍රාග් ඓතිහාසික යුගය සිට රජරට අවසාන දක්වා | (4) 0.73% | (17) 0.11 |
| ශ්‍රී ලංකාවේ ඉතිහාසය පසුකාලීන රාජධානි | (9) 0.51 % | (11) 0.22 |
| ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන් | (10) 0.52% | (37) 0.19 |
| ලෝක ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා | (34) 0.55% | (39) 0.28 |
| ආසියාතික රටවල ථේරවාදී බෞද්ධ සංස්කෘතිය | (20) 0.51% | (40) 0.20 |




**ප්‍රස්තාරය 2.3**

ඉතිහාසය I ප්‍රශ්න පත්‍රය සැකසීමේදී පදනම් කරගත් තේමා 7 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි සාමාන්‍ය පහසුතාව හා එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට රජරට ශිෂ්ටාචාරයේ අවසානය දක්වා තේමාව යටතේ ඉදිරිපත් වූ සමස්ත ප්‍රශ්නවල සාමාන්‍ය පහසුතාව 50%කි. එය මෙම තේමා අතුරෙන් පහසුතාව වැඩිම තේමාව වේ.

## 2.5 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- ඉතිහාසය I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. මෙම ප්‍රශ්න පත්‍රය මගින් ඉතිහාසය විෂයය පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම, ආකල්ප, කුසලතා, සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.

- මෙම බහුවරණ ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී 1, 2 යන ප්‍රශ්න ඓතිහාසික මූලාශ්‍රය නම් තේමාව අනුව සැකසී ඇත. එම කොටසේ ප්‍රශ්නවල සාමාන්‍ය පහසුතාව 36%කි. මෙම ප්‍රශ්න 02 අතුරින් පහසුතාව වැඩි ම ප්‍රශ්නය 1 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 52%කි. මෙම කොටසේ පහසු ම ප්‍රශ්නය වී ඇත්තේ එය යි. විදේශීය සාහිත්‍ය ආගන්තුක වීම නිසා ඒ පිළිබඳ අඩු අවධානයක් යොමුවන්නට ඇතැ යි සිතිය හැකි ය. එසේ ම 2 ප්‍රශ්නයේ පහසුතාව 21% වන අතර පුරාවිද්‍යා මූලාශ්‍ර කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමුවීම අඩු වීම ඊට හේතු වන්නට ඇත. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එම කොටස්වලට වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම පිළිබඳ තේමාව යටතේ 3, 13 හා 33 යන ප්‍රශ්න සකස් වී ඇත. එම කොටසේ ප්‍රශ්නවල සාමාන්‍ය පහසුතාව 43%කි. මෙම ප්‍රශ්න 03 අතුරින් පහසුතාව වැඩිම 3 ප්‍රශ්නයෙහි පහසුතාව 53%කි. මෙම කොටසේ පහසුම ප්‍රශ්නය වී ඇත්තේ එය යි. එහි පහසුතාව 53%ක් වන හෙයින් ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කෙරෙහි අඩු අවධානයක් යොමු වී ඇති බව පැහැදිලි ය. එසේ ම 33 ප්‍රශ්නය මෙම කොටසේ පහසුතාවය අඩු ම ප්‍රශ්නය වේ. එහි පහසුතාව 0.37කි. මෙහි ඇති වරණයට අදාළ පැරණි නම් නියමාකාරයෙන් අවබෝධ කර නොගැනීම අඩු ශිෂ්‍ය සාධනයට හේතුවන්නට ඇතැයි පෙන්වා දිය හැකි ය. මෙම වරණ හා සම්බන්ධ අතීත නාමයන් මනා ලෙස අවබෝධ කරගැනීමට අපේක්ෂකයන් පුහුණු කළ යුතු ය.

- I පත්‍රයේ ඇති ප්‍රශ්න අතුරෙන් වැඩි ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත් වන්නේ තෙවන තේමාවට යි. එම තේමාව යටතේ ඉදිරිපත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 14කි. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩි ම 4 ප්‍රශ්නයෙහි පහසුතා 73%කි. පහසුතාව අඩු ම ප්‍රශ්න වී ඇත්තේ 5 හා 17 යන ප්‍රශ්නයි. එම ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 36%ක් හා 11%ක් වේ. වරණයෙහි අන්තර්ගතය නියමාකාරයෙන් අවබෝධකර නොගැනීම ඉතා අඩු පහසුතාවයට හේතු වී ඇතැ යි පෙන්වා දිය හැකි ය. වරණයන්හි අන්තර්ගතය මෙන් ම නිවැරදි වරණ තෝරා ගැනීම සම්බන්ධයෙන් දී ඇති උපදෙස් මනා ලෙස අවබෝධ කර ගැනීමට අපේක්ෂකයන් පුහුණු කළ යුතු ය.

- 4 තේමාව යටතේ ප්‍රශ්න 05ක් ඉදිරිපත් වී ඇත. මෙම ප්‍රශ්න අතුරින් පහසුතාව වැඩිම 9 ප්‍රශ්නයෙහි පහසුතාව 51%කි. පහසුතාව අඩු ම 11 ප්‍රශ්නයෙහි පහසුතාව 22%කි. 9 ප්‍රශ්නයට අදාළ ක්ෂේත්‍ර පිළිබඳ දැනුම වෙනත් විෂයන්ගෙන් ද ආවරණය වීම පහසුතාව යම් ප්‍රමාණයකට ඉහළ යාමට හේතු වී ඇතැ යි අනුමාන කළ හැකි ය. 11 ප්‍රශ්නයේ අඩු පහසුතාවට එම ප්‍රශ්නය තරමක් දුරට හුදකලා සිද්ධියක් පිළිබඳ විමසා තිබීම හේතු විය හැකි ය. එබැවින් හුදකලා සිදුවීම් වුව ද ඓතිහාසික වටිනාකමක් ඇති බැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එවැනි සිද්ධි පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

- 5 තේමාව යටතේ ප්‍රශ්න 08ක් අඩංගු වේ. මේවා අතුරෙන් පහසුතාව වැඩි ම 10 ප්‍රශ්නයෙහි පහසුතාව 52%කි. මෙම ප්‍රශ්නයට අදාළ වගුගත කිරීම් මගින් සිදුකරන ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය නිසා නිවැරදි පිළිතුර සැපයීම යම් ප්‍රමාණයකට ඉහළ යාමට එය හේතුවන්නට ඇත. එහෙත් බ්‍රිතාන්‍ය සමයේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොමැති වීම සාර්ථක පිළිතුරු සැපයීම තවදුරටත් ඉහළ යාමට බාධාකාරී වන්නට ඇත. මෙම තේමාව යටතේ පහසුතාව අඩුම 37 ප්‍රශ්නයෙහි පහසුතාව 19%කි. බටහිර ජාතීන් පිළිබඳ තොරතුරු ඇතුළත් පාඩම් පෙළපොත්වල ඇතුළත් කර ඇතත් ඒවා පිළිබඳ අනවබෝධය අඩු පහසුතාවට හේතු වූවා විය හැකි ය. පෙළපොත්වල ඇතුළත් අදාළ පාඩම් පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- 6 තේමාවට අදාළ ව ප්‍රශ්න 05ක් ඇතුළත් වේ. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය වන 34 ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි. පහසුතාව අඩු 39 ප්‍රශ්නයෙහි පහසුතාව 28%කි. ලෝක ශිෂ්ටාචාර පිළිබඳ දැනුම ආගන්තුක වීම පහසුතාව අඩු වීමට හේතු වූවා විය හැකි ය. ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයේ දී සරල හා ප්‍රිය මනාප ක්‍රමවේද භාවිතයෙන් දැනුම පුළුල් කළ හැකි ය.

- 7 තේමාව යටතේ ප්‍රශ්න තුනක් ඇතුළත් වේ. එහි පහසුතාව වැඩි ම 20 ප්‍රශ්නයෙහි පහසුතාව 51%කි. එම තේමාව යටතේ පහසුතාව අඩු ම 40 ප්‍රශ්නයෙහි පහසුතාව 20%කි. පොදුවේ ගත්විට තේමා බොහොමයකට අපේක්ෂකයන් දක්වා ඇති ප්‍රතිචාර සාධනීය මට්ටමක නොපවතී. ඊට හේතු වී ඇත්තේ ප්‍රධාන මාතෘකා පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොතිබීම ය. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අඩු පහසුතා ඇති තේමා කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු


### 3.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර සෙසු ප්‍රශ්න හතෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 60කි.

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම : | I පත්‍රය | = | 40 |
| | II පත්‍රය | = | 60 |
| | අවසාන ලකුණු | = | 100 |

ඉතිහාසය I හා II පත්‍ර සඳහා නියමිත කාලය පැය 03කි.


## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය




**ප්‍රස්තාරය 3.1** (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එහෙත් ඊට පිළිතුරු සපයා ඇත්තේ 95.45%ක ප්‍රතිශතයකි. සෙසු ප්‍රශ්න අතුරෙන් වැඩිම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ දෙවන ප්‍රශ්නය ට වන අතර, එය ප්‍රතිශතයක් ලෙස 81%කි. අඩුම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ හයවන ප්‍රශ්නයට වන අතර එය ප්‍රතිශතයක් ලෙස 19%කි. දෙවන ප්‍රශ්නය වැඩිම පිරිසක් තෝරාගැනීමට හේතුවන්නට ඇත්තේ තේරුම්ගැනීමට පහසු විෂය කොටස් අන්තර්ගත වීම හා එම කථාපුවත් සාමාන්‍ය ව්‍යවහාරයේ ද පැවතීම විය හැකිය. හයවන ප්‍රශ්නය අඩු පිරිසක් තෝරාගනු ලැබීමට හේතුවිය හැක්කේ, II පත්‍රයේ මුල් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහසුවීමත්, මෙම ප්‍රශ්නයට අදාළ කොටස් විෂය නිර්දේශයේ අවසන් පාඩම් වීම හා ප්‍රශ්න පත්‍රයේද අග කොටසට අයත් වීමත් විය හැකිය. සිසු අවධානය මෙම පාඩම් කෙරෙහි යොමු නොවීමත් මෙසේ තෝරාගැනීම අවම වීමට හේතුවන්නට ඇත. බොහෝදුරට 5වන ප්‍රශ්නයේ සිට 8 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්න තෝරාගැනීම අවම වීමට ඉහත කරුණම හේතුවන්නට ඇත.

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය හා විශ්ලේෂණය





**ප්‍රස්තාරය 3.2** (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත. උදාහරණය - මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය 12කි. අපේක්ෂකයන්ගෙන් 21%ක පිරිසක් ලකුණු 00-03 අතර ලබාගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 36%ක පිරිසක් ලකුණු 04-06 අතර ලබාගෙන ඇති අතර අපේක්ෂකයන්ගෙන් 24%ක් ලකුණු 07-09 අතර ලකුණු ලබාගෙන ඇත.ලකුණු 10-12 අතර ලබාගත් පිරිස 19%කි.

මෙම එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

## 3.4 II ප්‍රශ්න පත්‍රයේ සාධනය




**ප්‍රස්තාරය 3. 3** (RD/ 16 / 04/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් වැඩිම ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 1(ii) (අ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.85කි. 1(ii) (අ) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 85%ක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 5(iii) කොටසෙහි පහසුතා දර්ශකය 0.16කි. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 16%කි.

## 3.5. II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණුදීමේ පටිපාටිය

### 1 ප්‍රශ්නය

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

**(ඇමුණුම 01)**


1. පුලස්තිපුර    2. කොළඹ    3. මඩකලපුව
4. මැණික් ගඟ    5. යාපහුව    6. සූකරතිත්ථ

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

● පහත දී ඇති ***A*** හා ***B*** රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) (අ) ***A*** වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) එය හමු වූ දිස්ත්‍රික්කය කුමක් ද?
(ඉ) එය හා සම්බන්ධ රජතුමා කවරෙක් ද?


*(ලකුණු 03 යි)*




***A***

(iii) (අ) ***B*** වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
(ඉ) මෙම ගොඩනැගිල්ල ඉදි කළ රජතුමා කවු ද?

*(ලකුණු 03 යි)*




**1** (i)



**පිළිතුරු**

1.



(ලකුණු 06යි)

(ii) (අ) ඇත් පහන

(ආ) කෑගල්ල දිස්ත්‍රික්කය

(ඉ) පළමුවන / මහා පරාක්‍රමබාහු රජතුමා

(ලකුණු 03යි)


(iii) (අ) නිශ්ශංක ලතා මණ්ඩපය

(ආ) පොළොන්නරුව / පුලතිසිපුර

(ඉ) නිශ්ශංකමල්ල රජතුමා

(ලකුණු 03යි)

### 3.5.1 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.4 (a)

1 ප්‍රශ්නය අනිවාර්ය වේ. ප්‍රස්තාරය 3.1 අනුව මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂක ප්‍රතිශතය 95.45%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට අනුව,

ලකුණු 0-3 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 4-6 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 7-9 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 19%ක් ද,

ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 19%කි. අපේක්ෂකයන් 21%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.4 (b)

මෙම ප්‍රස්තාරයෙන් දක්වෙන 1 ප්‍රශ්නයෙහි කොටස් 03කි. ඉන් (ii) කොටස සඳහා අනුකොටස් 3ක් ද (iii) කොටස සඳහා අනුකොටස් 3ක් ද ඇත. පහසුතාව 50%ට වඩා වැඩි අනුකොටස් සංඛ්‍යාව 5කි. 1 (ii) (අ) වැඩිම පහසුතාවකින් යුත් අනුකොටස වේ. එහි පහසුතාව 85%කි. (i) කොටස අඩුම පහසුතාවකින් යුතුවන අතර එහි පහසුතාවය 23%කි.

- පළමු ප්‍රශ්නයේ (i) කොටස ශ්‍රී ලංකාවේ සිතියම ලකුණු කිරීම හා සම්බන්ධ වේ. එහි පහසුතාව 23%කි. සිතියම් ලකුණු කිරීම හා ස්ථාන හඳුනාගැනීමට අපහසුවීම අඩු ශිෂ්‍ය සාධනයට හේතුවන්නට ඇත.

- පළමු ප්‍රශ්නයේ (ii) කොටසේ (අ), (ආ) සහ (ඉ) අනුකොටස් සඳහා රූපය පිහිටි ස්ථානය හා නිර්මාණකරු පිළිබඳ විමසීම් සඳහා පහසුතාව පිළිවෙලින් 85%, 41% සහ 53% වේ. අවම සාධනය දක්වා ඇත්තේ එය හමුවූ දිස්ත්‍රික්කය සම්බන්ධයෙනි.

- (iii) කොටසේ (අ), (ආ) සහ (ඉ) අනුකොටස් සඳහා පහසුතාව 75%කට වඩා වැඩි වී ඇත. රූපය හඳුනාගැනීමට පහසුවීම එයට සාර්ථකව පිළිතුරු සැපයීම සිදු කිරීමට හේතු වන්නට ඇත.

- මෙම ප්‍රශ්නයෙහි සිතියම් කොටස සඳහා සාධන මට්ටම වැඩිදියුණු කිරීම සඳහා ස්ථාන හඳුනාගැනීමට හා සිතියම් ලකුණු කිරීමට සිසුන් යොමු කිරීම යෝග්‍ය වේ.

## 2 ප්‍රශ්නය

(i) විජයගෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණි ජන කණ්ඩායම් **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස සඳහා නිදසුන් **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ''දේවානම්පියතිස්ස රාජ්‍ය සමය මෙරට ඉතිහාසයේ කැපී පෙනෙන යුගයක් වේ.'' එය සාධක **තුනක්** යටතේ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**පිළිතුරු**

(i)

- පාණ්ඩ්‍ය කුමාරිකාව සමග පැමිණි පිරිස
- පණ්ඩුවාසදේව සමග පැමිණි පිරිස
- භද්දකච්චායනා සොහොයුරන් ඇතුලු පිරිස
- මිහිඳු මහරහතන්වහන්සේ ඇතුලු පිරිස
- සංඝමිත්ත තෙරණිය සහ පිරිස

(මින් දෙකක් සඳහා ලකුණු 02යි)

(ii)

- යක්ෂ වන්දනාව
- වෘක්ෂ වන්දනාව
- දේව වන්දනාව
- ආජීවක හා පරිබ්‍රාජක ආගම්
- බ්‍රාහ්මණ ආගම
- බෞද්ධාගම


(මින් දෙකක් සඳහා ලකුණු 04යි)

(iii)

- මෙතුමාගේ රාජ්‍ය කාලයේ සිට ලංකා ඉතිහාසයේ පිළිගතහැකි කාල නිර්ණයක් ඉදිරිපත් කළ හැකි වීම
- මෞර්ය රාජ්‍යය සමඟ සුහද සබඳතා පැවැත්වීම
- මෞර්ය අභිෂේක ක්‍රමය හඳුන්වාදීම
- බුදුදහම හඳුන්වාදීම
- මිහිඳු හිමිගේ ආගමනය
- සංඝමිත්තාවගේ හා විවිධ ශිල්පශ්‍රේණිවල ආගමනය
- ශ්‍රී මහා බෝධිය වැඩමවීම
- ථූපාරාමය ඇතුලු මහා විහාරය සැලසුම් කිරීම

(මින් කරුණු 03ට ලකුණු 03යි විස්තරයට ලකුණු 03 = 06යි)

### 3.5.2 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





**ප්‍රස්තාරය 3.5 (a)**

3.1 ප්‍රස්තාරයට අනුව 2 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 87%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 12ක් හිමිවේ. පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට අනුව,

ලකුණු 0-3 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 4-6 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 7-9 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 39%ක් ද, ලෙස ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් ප්‍රතිශතය 39%කි. අපේක්ෂකයන් 9%ක් ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත.




**ප්‍රස්තාරය 3.5 (b)**

මෙම ප්‍රස්තාරයෙන් දක්වෙන 2 ප්‍රශ්නයේ කොටස් තුනකි. ඉන් (i), (ii) කොටස්වල පහසුතාව 70%ට වැඩි වේ. (iii) කොටසේ පහසුතාව 50% ක් වේ. ඒ අනුව මෙහි මෙහි වැඩිම පහසුතාව 73% ලෙස (ii) කොටසටද, අඩුම පහසුතාව 50% ලෙස (iii) කොටසටද හිමිව ඇත.

- 2 ප්‍රශ්නය ශ්‍රී ලංකාව ජනාවාස වීම, මුල් ජනාවාසවල ඇදහිලි හා විශ්වාස සහ දේවානම්පියතිස්ස රජුගේ පාලන සමය ලාංකික ශිෂ්ටාචාරය කෙරෙහි සිදුකළ බලපෑම යන කරුණු පිළිබඳ අවබෝධය පිරික්සීම සඳහා සකස් වී ඇත.
- අපේක්ෂකයන් අතුරෙන් 87%ක් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමසඳහා තෝරාගෙන ඇත. එමප්‍රශ්නයෙහි කොටස් අතුරෙන් (ii) කොටසේ පහසුතාව 73%ක් වේ. (iii) කොටසේ පහසුතාව සඳහා 50%කි.
- මෙම ප්‍රශ්නය සඳහා සාධන මට්ටම ඉහළ යාමට 3 සහ 4 ශ්‍රේණිවලදී එම විෂය අන්තර්ගත කොටස් අධ්‍යනය කිරීමට හැකිවීම , සහ බෞද්ධයන් ලෙස ඊට අදාළ කොටස් පිළිබඳ පවතින සාමාන්‍ය දැනුමද හේතුවන්නට ඇත.
- මෙහි (iii) කොටස සඳහා සාධන මට්ටම අඩුවීම කෙරෙහි සිසුන් තුළ පැවති විචාරශීලීව කරුණු පෙළගැස්සීමේ හා කරුණු නිවැරදිව මතක තබා ගැනීමේ දුර්වලතා හේතුවන්නට ඇත. විචාරශීලීව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම වර්ධනය කිරීම සඳහා පෙරහුරු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම හා ආදර්ශ ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම ආදී ක්‍රමවේද අනුගමනය කළ යුතු අතරඑමගින් සිසු සාධන මට්ටම් ඉහළ නැංවීමට හැකිවනු ඇත.

**3** ප්‍රශ්නය

(i) අනුරාධපුර රාජධානි සමයේ ඉදිකළ ඇළමාර්ග **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඇළමාර්ග හා බැඳුණ තාක්ෂණ ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) වැවක ප්‍රධාන තාක්ෂණික අංග **තුනක්** නම් කර එහි ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**පිළිතුරු**

(i) ඇළහැර ඇළ, පබ්බතන්ත ඇළ, යෝධ ඇළ (ජයගඟ)

(ඇළ මාර්ග දෙකක් සඳහා ලකුණු 02යි)

(ii)


- ජල පහරේ වේගය පාලනය කිරීමට ගල් අත්තිවාරම් බැඳීම සහ වේල්ලේ ඇතුල් පැත්තේ ගල් කණු සිටවීම
- අතිරික්ත ජලය පිට කිරීමට කළු ගලින් සැකසූ වාන් සකස් කිරීම
- උමං මාර්ගයෙන් පොකුණුවලට ජලය ගෙනයාම
- සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙනයාම
- භූමියේ පිහිටීම පිළිබඳව සැලකිලිමත් වීම
- සමස්ත වියළි කලාපයම ආවරණය වන පරිදි ඇළමාර්ග සැකසීම.

(කරුණු දෙකක් සඳහා ලකුණු 04යි)

(iii) වැව් බැම්ම, රළපනාව, සොරොව්ව, බිසෝ කොටුව, පිටවාන, ඇතුළුවාන, ......
මින් තුනක් සඳහන් කර එහි තාක්ෂණය විස්තර කළ යුතුයි.

(නම් කිරීමට ලකුණු 03යි, විස්තරයට ලකුණු 03 = 06යි)

### 3.5.3 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.6 (a)

3.1 ප්‍රස්තාරයට අනුව පිළිතුරු සැපයීම සඳහා 3 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 75%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. ඉන්,

ලකුණු 0-3 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 4-6 ප්‍රාන්තරයේ 42% ක් ද,
ලකුණු 7-9 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලෙස ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් ප්‍රතිශතය 16%කි. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබාගත් ප්‍රතිශතය 18%ක් වේ.




ප්‍රස්තාරය 3.6 (b)

මෙම ප්‍රස්තාරයෙන් දක්වෙන 3 ප්‍රශ්නය සඳහා කොටස් 3කි. මෙම (i) (ii) සහ (iii) යන කොටස් සඳහා පිළිතුරු සැපයීමේදී පහසුතාව පිළිවෙලින් 57%, 24% හා 50%ක් වී ඇත. ඒ අනුව වැඩිම පහසුතාව (i) කොටස සඳහා 57%ක් වූ අතර පහසුතාව අඩුම (ii) කොටසෙහි පහසුතාව 24%ක් වේ.

- 3 ප්‍රශ්නය රජරට ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්ත හා වාරි තාක්ෂණය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා සකස් වී ඇත.
- මෙම ප්‍රශ්නය අපේක්ෂකයන් අතුරෙන් 75%ක් පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත. එහෙත් මෙම ප්‍රශ්නයෙහි පහසුතාව සැලකීමේ දී (i) කොටස සඳහා පමණක් පහසුතාව 50% ඉක්මවා ඇති අතර එහි පහසුතාවය 57%කි. අවම පහසුතාව සහිත (ii) කොටසෙහි පහසුතාව 24%කි.
- අපේක්ෂකයන් වැඩි පිරිසක් මෙම ප්‍රශ්නය තෝරා ගත්තද එහි සාධන මට්ටම පහළ අගයක් ගෙන ඇත. එයට හේතුවන්නට ඇත්තේ අපේක්ෂකයන්ට මීට අදාළ විෂය කොටස් පැහැදිලිව අවබෝධ කරගැනීමට හා ඒවා මතකතබා ගැනීමට දුෂ්කර වීම නිසා විය හැකි ය.
- මෙම අන්තර්ගත කොටස් ඇසුරෙන් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා පින්තූර, වීඩියෝ දර්ශන හෝ ප්‍රායෝගිකව එම තාක්ෂණික නිර්මාණ නැරඹීමට අවස්ථාව දීම ආදී ප්‍රායෝගික අද්දැකීම් ලබාදෙමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද සකස්කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

**4 ප්‍රශ්නය**

(i) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ මව්පියන් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික සේවා **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) එතුමාගේ ආර්ථික සේවය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**පිළිතුරු**

(i) මානාභරණ . - පියා
රත්නාවලී කුමරිය . - මව

(ලකුණු 02යි)


(ii)
- සංඝ සංශෝධනය කර තුන් නිකාය එක්සත් කිරීම
- ජේතවන විහාරය ඉදි කිරීම
- ආලාහන පිරිවෙන ඉදිකිරීම
- ගල්විහාරය (උත්තරාරාමය), දෙමළ මහා සෑය ඉදිකිරීම
- විහාරා රාම ප්‍රතිසංස්කරණය කිරීම

(කරුණු 02 ට ලකුණු 04යි)

(iii)
- දක්ඛිණ දේශයේ පාලකයා වූ අවධියේ කළ සේවාව
- පරාක්‍රම සමුද්‍රය ඉදිකිරීම
- වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම

(කරුණු තුනට ලකුණු 03යි, විස්තරයට ලකුණු 03 = 06යි)

### 3.5.4 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.7 (a)

3.1 ප්‍රස්තාරයට අනුව 4 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 67%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. ඉන්,

ලකුණු 0-3 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 4-6 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 7-9 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 7%ක් ද, ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 7%කි. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 35%ක් වේ.




ප්‍රස්තාරය 3.7 (b)

4 ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත වේ. ඒ අතුරින් පහසුතාව වැඩිම (ii) කොටසෙහි පහසුතාව 58%කි. පහසුතාව අවම (iii) කොටසෙහි පහසුතාව 33%ක් වේ.

- හතරවන ප්‍රශ්නය පළමුවන පරාක්‍රමබාහු රජු හා එතුමන්ගේ ආර්ථික හා ආගමික කාර්යන් පිළිබඳ අපේක්ෂකයන් තුළ අවබෝධය පිරික්සීම සඳහා සකසා ඇත.
- අපේක්ෂකයන් අතුරෙන් 67%ක් මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත. එහි (i), (ii) හා (iii) කොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 45%, 58%, හා 33% වේ. ඒ අනුව ප්‍රශ්නය තෝරාගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පැවතියද, එහි සාධන මට්ටම සාපේක්ෂව අඩු අගයකි.
- මෙම ප්‍රශ්නය සඳහා සාධන මට්ටම ඉහළ නොයාමට ප්‍රශ්නය මඟින් පිරික්සා ඇති දැනුම කොටස් පිළිබඳ මතකය අපේක්ෂකයන් සතු නොවීම හේතුවන්නට ඇත.
- අපේක්ෂකයන් තුළ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා විෂය අන්තර්ගත කොටස් පිළිබඳනිරවුල්අවබෝධයක් ලබාදීම, එය ශිෂ්‍ය කේන්ද්‍රීයව ලැදියා ඇතිවන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද අනුගමනය කරමින් ක්‍රියාත්මක කිරීම හා කරුණු සංවිධානය කරගනිමින් මෙවැනි ප්‍රශ්න

## 5 ප්‍රශ්නය

(i) පහත සඳහන් රජවරු අයත් රාජධානි පිළිවෙළින් නම් කරන්න.

(අ) තුන්වන විජයබාහු

(ආ) හතරවන පරාක්‍රමබාහු *(ලකුණු 02 යි)*

(ii) යාපනය රාජ්‍යයය බිඳවැටීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) නිරිත දිග රාජධානි සමයේ ශ්‍රී ලංකාවේ ආගමික හා ආර්ථික තත්ත්වය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**පිළිතුරු**

(i) (අ) දඹදෙණිය

(ආ) කුරුණෑගල

(ලකුණු 02යි)

(ii)

රාජ්‍ය උරුමකරුවන් අතර අරගල ඇතිවීම

ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොසිටීම

ස්වභාවික ආරක්ෂාව නොතිබීම

පෘතුගීසින්ගේ යුධ ශක්තිය සහ උපාය මාර්ග

(කරුණු 02ට ලකුණු 04යි)

(iii) ආගමික


- ප්‍රධාන ආගම බුදුදහම වීම
- මහායාන හා හින්දු විශ්වාස වර්ධනය වීම
- ඕනෑම ආගමක් ඇදහීමට ජනතාවට අවසර තිබීම

ආර්ථික

- මහවැව් ඉදි නොවීම/ වැසි ජලය යොදාගෙන ගොවිතැන් කිරීම
- හේන් ගොවිතැන හා අපනයන බෝග කෙරෙහි උනන්දුව
- දේශීය හා විදේශීය වෙළෙඳාම.

(කරුණු 03ට ලකුණු 03යි, විස්තරයට ලකුණු 03යි = 06යි)

### 3.5.5 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





**ප්‍රස්තාරය 3.8 (a)**

3.1 ප්‍රස්තාරයට අනුව පිළිතුරු සැපයීම සඳහා 5 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 30%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට අනුව,

ලකුණු 0-3 ප්‍රාන්තරයේ 67%ක් ද,
ලකුණු 4-6 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 7-9 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 03%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් ප්‍රතිශතය 3%කි. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබාගත් ප්‍රතිශතය 67%ක් වේ.




**ප්‍රස්තාරය 3.8 (b)**

මෙම ප්‍රස්තාරයෙන් දැක්වෙන 6 ප්‍රශ්නයෙහි කොටස් තුනකි. ඉන් පහසුතාව 50% ඉක්ම වූ අනුකොටස් දෙකකි. පහසුතාව වැඩිම (i) (අ) අනුකොටසෙහි පහසුතාව 58%කි. පහසුතාව අඩුම (iii) කොටසෙහි පහසුතාව 16%කි.

- 5 ප්‍රශ්නය රජරට රාජධානි බිඳවැටීමෙන් පසු බිහිවූ රාජධානි පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා සකස් කර ඇත.

- මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා අපේක්ෂකයන් අතුරෙන් 30%ක් තෝරාගෙන ඇති අතර, එහි (i) (අ) , (ආ), (ii) සහ (iii) කොටස් සඳහා පහසුතාව පිළිවෙලින් 58%, 45% , 26% සහ 16%ක් වේ. ඒ අනුව ප්‍රශ්නය තෝරාගැනීම හා සාධන මට්ටම පහළ අගයකින් යුක්ත වේ.

- එම තොරතුරු අනුව අපේක්ෂකයන් අතර අදාළ අන්තර්ගත කොටස් ජනප්‍රිය නොවීම තෝරාගැනීම පහළ මට්ටමක පැවතීමට හේතුවන්නට ඇත. එමෙන්ම ප්‍රශ්නයට අදාළ විෂය කරුණු නොදැනීම හා දන්නා විෂය කරුණු සංවිධානය කරගැනීමේ අපහසුතාවද හේතුවන්නට ඇත.

- මීට අදාළ ව සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා අභ්‍යාස කරවීම හා ආදර්ශ ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට හුරුකරවීම අත්‍යාවශ්‍ය වේ.

## 6 ප්‍රශ්නය

(i) ආසියාවේ බලය පිහිට වූ යුරෝපා රටවල් (පෘතුගාලය හැර) **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) යුරෝපා ජාතීන් ආසියාවේ බලය ව්‍යාප්ත කිරීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පෘතුගීසින් කෝට්ටේ රාජ්‍ය තුළ සිය ආධිපත්‍ය තහවුරු කරගත් ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**පිළිතුරු**

(i) ඕලන්දය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ස්පාඤ්ඤය

(ලකුණු 02යි)

(ii)

- වෙළෙඳ වාසි ලබා ගැනීම
- ආගම ව්‍යාප්ත කිරීම
- මුස්ලිම්වරුන් සතුව පැවැති ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය හිමිකර ගැනීම
- යටත්විජිත ඇතිකර ගැනීම

(කරුණු දෙකට ලකුණු 04යි)

(iii)

කෝට්ටේ සමඟ වෙළෙඳ සබඳතා ගොඩනැගීම

කෝට්ටේ රාජ්‍යය බෙදී යාම හා ඒම රාජ්‍යයේ අභ්‍යන්තර ආරවුල් ඇති වීම


ධර්මපාල කුමරු රජකරවීම

ධර්මපාල රජුගෙන් පසු කෝට්ටේ පෘතුගීසින්ට අයිති වීම

සීතාවක රාජ්‍යය දුර්වල කිරීම

(කරුණු 03ට ලකුණු 03යි, විස්තරයට ලකුණු 03යි = 06යි)

### 3.5.6 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.9 (a)

3.1 ප්‍රස්තාරයට අනුව 6 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 19%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට අනුව,

ලකුණු 0-3 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 4-6 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 7-9 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 0%ක් ද, ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් කිසිවෙකුත් නොමැත. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබාගත් ප්‍රතිශතය 29%ක් වේ.




ප්‍රස්තාරය 3.9 (b)

මෙම ප්‍රස්තාරයෙන් දක්වෙන 6 ප්‍රශ්නය සඳහා කොටස් 3කි. ඒ අතුරෙන් පහසුතාව 50% ඉක්ම වූ කොටස් 2කි. පහසුතාව වැඩිම (ii) කොටසෙහි පහසුතාව 55%කි. පහසුතාව අඩුම (iii) කොටසෙහි පහසුතාව 20%කි.

- 6 ප්‍රශ්නය යුරෝපා රටවල්, ආසියාව කෙරෙහි අවධානය යොමුකිරීම හා පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යය තුළ බලය තහවුරු කරගැනීම සම්බන්ධ අවබෝධය පිරික්සීම සඳහා සකසා ඇත.
- මෙම ප්‍රශ්නය පිළිතුර සැපයීම සඳහා අපේක්ෂකයන් අතුරෙන් 19%ක් තෝරාගෙන ඇත. එය අනෙකුත් ප්‍රශ්න තෝරාගැනීම හා සාපේක්ෂව අවම අගයකි. එහි (i), (ii) හා (iii) කොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 52%, 55%, සහ 20% වේ. (iii) කොටස සඳහා සිසු සාධන මට්ටම ඉතා පහළ අගයක් ගනියි.
- සිසුන් අතර මෙම විෂය කොටස් ජනප්‍රිය නොවීම ප්‍රශ්නය තෝරා නොගැනීමට හේතුවන්නට ඇත. එහෙත් යුරෝපා රටවල ආධිපත්‍ය හා බලපෑම ශ්‍රී ලංකාවේ ඓතිහාසික විකාශනයේ ප්‍රධාන සංධිස්ථානයක් සලකුණු කරයි. වර්තමානයේ බලපෑමක් වන ගෝලීය ප්‍රවණතා අවබෝධ කරගැනීමට මෙම කොටස් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙයින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ ක්‍රමෝපායන් භාවිත කරමින්, ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද අනුගමනය කිරීම අවශ්‍ය වේ. එමෙන්ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ අභ්‍යාස කරවීම ද අත්‍යවශ්‍ය වේ.

## 7 ප්‍රශ්නය

(i) (අ) 1815 වනවිට කන්ද උඩරට රජතුමා

(ආ) 1815 වනවිට ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉංග්‍රීසි ජාතිකයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) බ්‍රිතාන්‍යයන්ට උඩරට බලය අල්ලා ගැනීමට ආධාර වූ හේතු **තුනක්** පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**පිළිතුරු**

(i) (අ) ශ්‍රී වික්‍රම රාජසිංහ

(ආ) රොබට් බ්‍රවුන්රිග්

(ලකුණු 02යි)

(ii)

- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
- ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙරළවල නාවික සහ වෙළෙඳ කටයුතු ශ්‍රී ලංකාවේ සිට මෙහෙයවීමට හැකි වීම
- ත්‍රිකුණාමලය වරාය නැව් ආරක්ෂිතව නවතා තැබිය හැකි ස්ථානයක් වීම
- ප්‍රංශයන් සමඟ සටන්වලදී ත්‍රිකුණාමලය වරාය වැදගත් වීම
- වටිනා වෙළෙඳ භාණ්ඩ රැසක් ශ්‍රී ලංකාවෙන් ලබාගත හැකි වීම


(කරුණු දෙකට ලකුණු 04යි)

(iii)

- රදලයින්ගේ ක්‍රියා කලාපය
- බ්‍රිතාන්‍යයන්ගේ උපක්‍රමශීලී ක්‍රියාමාර්ග
- රජුගේ අදූරදර්ශී ක්‍රියාකලාපය

(කරුණු 03ට ලකුණු 03යි, විස්තරයට ලකුණු 03යි = 06යි)

### 3.5.7 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා





ප්‍රස්තාරය 3.10 (a)

අංක 3.1 ප්‍රස්තාරයට අනුව 7 ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂක ප්‍රතිශතය 33%ක් වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට අනුව,

ලකුණු 00-03 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 04-06 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 07-09 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

7 ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 11%කි. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය




ප්‍රස්තාරය 3.10 (b)

මෙම ප්‍රස්තාරයෙන් දැක්වෙන 7 ප්‍රශ්නයේ කොටස් 3කි. (i) කොටසට අදාළව අනුකොටස් 2කි. ඒ අතුරෙන් පහසුතාව 50% ඉක්ම වූ අනුකොටස් 2කි. පහසුතාව වැඩිම 7 (i) (අ) අනුකොටසෙහි පහසුතාව 61%කි. පහසුතාව අවම 7 (i) (ආ) අනුකොටසෙහි පහසුතාව 26%කි.

- 7 ප්‍රශ්නය ඉංග්‍රීසීන් හා උඩරට රාජධානි පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා සකසා ඇත.

- මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 33%කි. මෙහි 7 (i) (අ), 7 (i) (ආ) යන අනුකොටස්වල හා 7 (ii) සහ 7 (iii) යන කොටස්වල පහසුතාව පිළිවෙළින් 63%, 26%, 51% හා 31%ක් වේ. මෙම ප්‍රශ්න තෝරාගැනීම් යම් සතුටුදායක මට්ටමක පැවතියත් අනුකොටස්වලට පිළිතුරු සැපයීමේදී සාධන මට්ටම පහළ ගොස් ඇත.

- මේ අනුව නම්කිරීම වැනි දැනුම මුල්කරගත් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අපේක්ෂකයන්ට දුෂ්කර වී ඇත.

- මෙවැනි ප්‍රශ්නවල සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා හැකි තරම් පාඩමට අදාළ අභ්‍යාස කරවීම සහ ආදර්ශ ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු ලිවීමට හුරු කරවීම අත්‍යවශ්‍ය වේ.

## 8 ප්‍රශ්නය

පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

(i) පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ
(ii) ග්‍රීක වාස්තු විද්‍යාව
(iii) සප්ත අපරිහානීධර්ම
(iv) ලන්දේසීන් විසින් ලාංකික සමාජයට හඳුන්වා දෙන ලද නවාංග

*(ලකුණු 06 × 2 = 12 යි)*

**පිළිතුරු**

(i) පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ

- ලෞකික හා ආගමික ගොඩනැගිලි ඉදි කිරීම
- හින්දු ගෘහනිර්මාණ කලාවේ ආභාෂය
- බෞද්ධ සහ හින්දු ආගමික ගොඩනැගිලි දක්නට ලැබීම
- ලෞකික ගොඩනැගිලි ලෙස රජ මාලිගා දක්නට ලැබීම
- මාලිගා ඉතා අලංකාර ලෙස සැලැස්මකට අනුව සකසා තිබීම
- තට්ටු ගොඩනැගිලි ඉදි කිරීම
- ගඩොලින් හා කලු ගලින් නිම කිරීම

(ලකුණු 06යි)

(ii) ග්‍රීක වාස්තු විද්‍යාව

- ලෝකයේ පැරණි වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් ග්‍රීකයන්ට විශේෂ තැනක් හිමිවීම.
- දෙවියන් සඳහා වෙන් වූ අලංකාර ගොඩනැගිලි නිර්මාණය කිරීම.
- ඩයෝනීසියස් රඟමඩල විශිෂ්ඨ නිර්මාණයක් වීම.
- මහල්වලින් සමන්විත වීම හා විවිධ පහසුකම්වලින් යුක්ත වීම.
- නිවාසවල මැද මිදුල වටා කාමර සකසා තිබීම.
- ගොඩනැගිලි ඉදි කිරීමට හුණු ගල් සහ ඔප දැමූ කිරිගරුඬ භාවිත කිරීම.
- ඩොරික්, ජියෝනියන්, කොරින්තියන් යන ශෛලීන් අනුව ගෘහ නිර්මාණ සිදු කිරීම.

(ලකුණු 06යි)

(iii) සප්ත අපරිහානී ධර්ම

- නිතර නිතර රැස් වී සාකච්ඡා කිරීම
- සමගිව කටයුතු කිරීම
- පෞරාණික වජ්ජි ධර්ම අනුව කටයුතු කිරීම
- ජ්‍යෙෂ්ඨයන්ට ගරු කිරීම
- කුල කාන්තාවන්ට ගරු කිරීම
- පරම්පරාවෙන් ආ ධාර්මික කටයුතු අඛණ්ඩව කිරීම
- මහණ බමුණන් නිසි ලෙස රැකබලා ගැනීම


(ලකුණු 06යි)

(iv) ලන්දේසීන් විසින් ලාංකික සමාජයට හඳුන්වා දෙන ලද නවාංග

- ලන්දේසි සංස්කෘතියට අනුව හැඩ ගැසුන පිරිසක් ශ්‍රී ලංකාව තුළ බිහි කිරීම
- රෙපරමාදු ක්‍රිස්තියානි ධර්මය ලාංකික සමාජයට එකතු කිරීම
- රෝම ලන්දේසි නීතිය ක්‍රියාත්මක කිරීම
- උසාවි පද්ධතියක් හඳුන්වා දීම
- තේසවලමේ නීතිය යාවත්කාලීන කිරීම
- ගෘහ නිර්මාණ ලක්ෂණ ලාංකික සමාජයට එකතු වීම
- ලංසි (බර්ගර්) ජන කොටස ලාංකික සමාජයට එකතු වීම
- පෙළපත් නාම, පුද්ගල නාම, ආහාර වර්ග, විවිධ වචන ලාංකික සංස්කෘතියට එකතු වීම.

(ලකුණු 06යි)

### 3.5.8 8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.11 (a)

අංක 3.1 ප්‍රස්තාරයට අනුව 8 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 30%ක් වේ. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ක් හිමිවේ. තෝරාගත් ප්‍රතිශතය අනුව,

ලකුණු 00-03 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 04-06 ප්‍රාන්තරයේ 46%ක් ද,
ලකුණු 07-09 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 10-12 ප්‍රාන්තරයේ 9%ක් ද, ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

ලකුණු 10ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් ප්‍රතිශතය 9%කි. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය 39%ක් වේ.




ප්‍රස්තාරය 3.11 (b)

මෙම ප්‍රස්තාරයෙන් දක්වෙන 8 ප්‍රශ්නයේ කොටස් 4කි. මෙම කොටස් හතරෙහිම පහසුතාව 50%ට අඩුවීම සුවිශේෂිතාවක් වේ. පහසුතාව වැඩිම 8(iii) කොටසෙහි පහසුතාව 41%කි. පහසුතාව අඩුම 8(i) කොටසෙහි පහසුතාව 23%ක් වේ.

- 8 ප්‍රශ්නය පොලොන්නරුවේ ගෘහ නිර්මාණ, ග්‍රීක වාස්තු විද්‍යාව, සප්ත අපරිහානී ධර්ම, ලන්දේසීන්ගෙන් ලාංකික සමාජයට එක් වූ නවාංග යන තේමාවන් පිළිබඳ අවබෝධය පිරික්සීම සඳහා සකසා ඇත.
- මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 30%කි. ශිෂ්‍ය සාධනය ඉතා පහළ අගයක් ගෙන ඇත. එනම් (i), (ii), (iii) සහ (iv) යන කොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 23%, 28%, 41% හා 27% වේ.
- සමස්තයක් ලෙස ගෙන බැලීමේදී මෙම ප්‍රශ්නයෙහි සාධන මට්ටම ඉතා පහළ මට්ටමක ඇති බව පෙනී යයි. එයට හේතුව මෙම ප්‍රශ්නය මඟින් ලංකාව හා ලෝකය ආශ්‍රිත අනුමාතෘකා ඇසුරින් කෙටි සටහන් ලිවීම අපේක්ෂා කිරීම හා අපේක්ෂකයන් එම මාතෘකා කෙරෙහි ප්‍රමාණවත් ලෙස අවධානය යොමු නොකිරීම විය හැකිය.
- මෙවැනි ප්‍රශ්නවල සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා විෂය නිර්දේශයට අදාළ සෑම කොටසක් කෙරෙහිම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමුකිරීම එම කොටස්වලින් ආදර්ශ ප්‍රශ්න සකසා සිසුන් පිළිතුරු ලිවීම සඳහා හුරු කරවීම අත්‍යවශ්‍ය වේ.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල සාමාන්‍ය පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ නිගමන හා යෝජනා




**ප්‍රස්තාරය 3.12** (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත වගුවට අනුව 1 ප්‍රශ්නය අනිවාර්ය වූවත්, අපේක්ෂකයන් අතුරින් 5% ක් පමණ ඊට පිළිතුරු සපයා නොමැත. 1 ප්‍රශ්නයෙහි පහසුතාව 62%කි. මෙය අනිවාර්ය ප්‍රශ්නයක් බැවින් සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා සිතියම් අභ්‍යාස කරවීම, පන්තිකාමරය තුළ නිවැරදි සිතියම් ප්‍රදර්ශනය කිරීම රූප සටහන් ඇසුරින් ප්‍රශ්න සකසා අභ්‍යාස කරවීම අත්‍යාවශ්‍ය වේ.

2 ප්‍රශ්නය තෝරාගැනීම මෙන්ම එහි පහසුතාවද ඉහළ අගයක් ගනියි. අපේක්ෂකයන් අතුරෙන් 87%ක් මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇති අතර එහි පහසුතාව 65%කි.

3 හා 4 වන ප්‍රශ්නය තෝරාගැනීම ඉහළ මට්ටමක වූවත් එහි කොටස් සඳහා පිළිතුරු සැපයීමේ දුර්වලතා මත එහි පහසුතාව යම් අඩු මට්ටමක පවතී. ප්‍රශ්නවලට පිළිතුරු සංවිධානය කරගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා අභ්‍යාසවල නිරත කරවීම මඟින් සිසුන්ගේ අවබෝධය වැඩිකරගත හැකිවනු ඇත.

ප්‍රශ්න 5, 7, 8 තෝරාගැනීම 30% ත් 33% ත් අතර පවතී. එම ප්‍රශ්නවල පහසුතාව 30% ත්, 43%ත් අතර පවතී. අවම තේරීමක් වූ 6 ප්‍රශ්නයෙහි පහසුතාව 42%කි. නමුත් එය 5 හා 8 ප්‍රශ්නවලට සාපේක්ෂව ඉහළ පහසුතාවකි.

II පත්‍රයෙහි එන යුරෝපය, ආසියාව ආදී ලෝක ශිෂ්ටාචාරය හා ප්‍රවණතා පිළිබඳ සිසුන් තුළ අවබෝධය හා දැනුම අඩු මට්ටමක ඇතිබව පෙනී යයි. එමනිසා අභ්‍යාස මෙන්ම වෙනත් ශ්‍රව්‍ය, දෘෂ්‍ය මාධ්‍ය උපයෝගී කරගනිමින් ඒ සඳහා පුහුණුව ලබාදීමට යෝජනා කෙරේ.

## 4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් හොඳින් කියවා තේරුම් ගැනීමටත්, ප්‍රශ්න තෝරාගැනීමටත් අමතර කියවීම සඳහා වූ කාලය යොදා ගත යුතුය. එම කාලය ලිවීම සඳහා යොදා නොගත යුතු ය.

- 1 වන ප්‍රශ්න පත්‍රයෙහි සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සැපයිය යුතුය. මෙහි දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන වරණය තෝරා ගත යුතු ය.

- ප්‍රශ්න සඳහා නියමිත කාලය කළමනාකරණය කරගත යුතු ය.

- II වන ප්‍රශ්න පත්‍රයේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විත වේ. 02 ප්‍රශ්නයේ සිට 08 ප්‍රශ්නය දක්වා ඇති ප්‍රශ්න 7න් 4කට පිළිතුරු සැපයිය යුතුය. කොටස් කිහිපයකින් යුතු ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී ඒ ඒ කොටසට නියමිත ලකුණු කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුරු සංවිධානය කළ යුතු ය.

- සෑම පිළිතුරක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු අතර නිවැරදි හා පැහැදිලි අත් අකුරු වලින් පිළිතුරු සැපයිය යුතුය. අක්ෂර වින්‍යාසය ව්‍යාකරණ නීති පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය.

- පිළිතුරු ලිවීම සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රස්තාව නිසි ලෙස භාවිතයට ගත යුතු ය.

- අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යයෙන්ම කළ යුතු ය.

- අපේක්ෂකයන් විසින් තම විභාග අංකය හා පිටු අංකය සෑම පිටුවකම පැහැදිලි ව අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

- ලියන ලද පිළිතුරක් ඉවත් කිරීමට අවශ්‍ය වූ විට තනි ඉරකින් කපා දැමිය යුතු ය.

- පිළිතුරු පත්‍රයේ පිටු නිවැරදි අංක පිළිවෙළට සැකසීම කළ යුතු ය.

## 5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ මාතෘකාවලට ගැළපෙන ඉගෙනුම් ආධාරක යොදාගැනීම කළ යුතු ය.

- නිවැරදි සිතියම් භාවිතා කරමින් සිතියම් ලකුණු කිරීමේ හා නම් කිරීමේ අභ්‍යාස නිරන්තරයෙන්ම සිදු කළ යුතු ය.

- පෙළ පොත් පරිශීලනය සඳහා සිසුන් තුළ පෙළඹවීමක් ඇති කළ යුතු ය.

- සිසුන්ගේ අභ්‍යාසකරණය දිරිමත් කළ යුතු අතර ඒ සඳහා නිසි ඇගයීමක් සිදු කළ යුතු ය.

- ඉතිහාසය විෂය පිළිබඳ දැනුම ලබාදීමේ දී ඓතිහාසික ස්ථාන පිළිබඳ ප්‍රායෝගික දැනීම සංවර්ධනය වන පරිදි වැඩසටහන් සකස් කළ යුතු ය.

- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- විෂය අන්තර්ගතයට අදාළ බාහිර පොතපත් පරිශීලනය සඳහා සිසුන් යොමු කළ යුතු ය.

- ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා සිසුන් යොමු කළ යුතු අතර ඒ සඳහා අවස්ථාව සලසා දිය යුතු ය.

- ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම මගින් කරුණු සංවිධානය කර ගැනීමේ කුසලතාව දරුවන් තුළ ඇති කළ යුතු ය.

- ප්‍රශ්න පත්‍රයේ II කොටසෙහි රචනාමය කොටස් සඳහා සිසුන්ගේ පිළිතුරුවල සාධන මට්ටම අවම බව පෙනී යන බැවින් රචනාමය ප්‍රශ්න පිළිබඳ අභ්‍යාස කළ යුතු අතර ඒවා විචාරශීලීව ගොඩනැගීම සඳහා පුහුණු කළ යුතු වේ.

- ඡායාරූප, වීඩියෝ වැනි දේ භාවිතය තුළින් සිසු හැකියාවන් වර්ධනය කර ගැනීමට උපකාරී විය යුතු ය.

Printed by
Department of Examinations Press